Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සමාජ විද්‍යා තරඟාවලිය - 2023

**අකුරැස්ස අධ්‍යාපන කලාපය**

**පාසල් කාණ්ඩය:-200 අඩු / 201-500 / 501-1000 / 1000 ට වැඩි**

**ශ්‍රේණිය:- 09**

**කාලය:-පැය 01 මිනිත්තු 30**

නම :- ............................................................

- **අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01).ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු හැඳින්වීමට භාවිතා කළ හැකි වෙනත් නමක් වන්නේ,

1.මහා අස්ථාන කුමරු　　2.කුණ්ඩසාලේ කුමාරයා

3.කිත්ති කුමරු　　4.ටිකිරි කුමරු

02).අතීතයේ ශ්‍රී ලංකාවේ භාවිතා කළ වරායන් අතර කොළඹ,හලාවත,කල්පිටිය වැදගත් විය.හලාවත වරාය හැඳින්වීමට භාවිතා කළ පැරණි නාමය වූයේ,

1.සල්වතොට　　2.මාතොට

3.ගිම්හ තිත්ථ　　4.කාල තිත්ථ

03).ශ්‍රී ලංකාවේ සිටි අවසාන ලන්දේසි ආණ්ඩුකාරවරයා වනුයේ,

1.ෆෙඩ්රික් නෝර්ත්　　2.බැරන් වැන් ඒක්

3.විලෙම් පැලක්　　4.ෆන් එංගල්බෙක්

04).ලෝකයේ වැඩිම ජනගහනයක් වෙසෙන ආසයාතික රට වන්නේ,

1.ඉන්දියාව　　2.පාකිස්ථානය

3.ජපානය　　4.චීනය

05).සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන රාජ්‍යනොවන ආයතනයක් වන්නේ,

1.අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය　　2.ශ්‍රී ලංකා පොලීසිය

3.ජාතික ළමා ආරක්ෂක අධිකාරිය　　4. හෙල්දි ලංකා

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06).1848 නිදහස් සටනට ආසන්නම හේතුව වූයේ,

1.බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුදුදහම නොසලකා හැරීම.

2.රජු හා මහජනතාව අතර සමීපතාව දුරස් වීම.

3.දේශීය කෘෂිකර්මාන්තය අඩපණ වීම.

4.ටොරින්ටන්සාමි විසින් පනවන ලද නව බදු වර්ග.

07).ක්‍රි.ව.1815 දී ශ්‍රී ලංකාව ඉංග්‍රීසීන්ට යටත් වීමට බලපෑ ප්‍රධානතම හේතුව වන්නේ,

1.ඉංග්‍රීසීන්ගේ යුධශක්තිය.

2.ජෝන් ඩොයිලිගේ උපායශීලී ක්‍රියාමාර්ග.

3.රජු දුර්වල පාලකයෙකු වීම.

4.රදලවරුන්ගේ බලපෑම.

08).ආසියා මහද්වීපයෙන් පිටත පිහිටි ගංගා නිම්නය වන්නේ,

1.ඉන්දු නිම්නය

2.හොවැංහෝ නිම්නය

3.නයිල් නිම්නය

4.යුප්‍රටීස් ටයිග්‍රීස් නිම්නය

09).පහතරට තෙත් කලාපයේ දැකිය ලක්ෂණයක් වන්නේ,

1.සංවහන වැසි ක්‍රියාත්මක වේ.

2.තෙත් හා වියළි කලාපයක් පවතී.

3.සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27C $^0$ වේ.

4.අවුරුද්ද පුරා වැසි ලැබේ.

10).ආගමික ආයතන වලින් ඉටුකරන ප්‍රධාන කාර්යයන් වන්නේ,

1.මත්ද්‍රව්‍ය වලින් ජනයා මුදවා ගැනීම.

2.සමාජවිරෝධී ක්‍රියා වැළැක්වීම.

3.ජාතික සමඟිය ගොඩනැගීම.

4.යහපත් ආකල්ප ඇති කිරීම.

- **අංක 11 සිට 15 තෙක් ගැළපෙන පිළිතුර ලියන්න.**

11).රාජාධිරාජසිංහ රජුගේ අභාවයෙන් පසු කන්නසාමි කුමාරයා ............................................ නමින් රජු බවට පත්විය.

12).1818 නිදහස් සටන අසාර්ථක වීමට බ්‍රිතාන්‍යයන්ගේ ....................................... හේතු විය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

13).දකුණු ඉන්දියාවෙන් නායක්කාර්වංශික කුමාරියක් ගෙන්වා විවාහ කර ගත් ................................ රජු සිංහල රාජවංශයේ අවසන් පාලකයා විය.

14). +.+.+.+.+.+ මෙට්‍රික් සිතියම් වල මෙම සංකේතයෙන් පෙන්නුම් කරනු ලබන්නේ ..................... මායිමයි.

15).පන්සලේ පියතුමා යන නමින් හැඳින් වූ ...................................... පියතුමා කා අතරත් ප්‍රසිද්ධියට පත් විය.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

16).ඉංග්‍රීසීන් හා උඩරට රදල ප්‍රධානීන් අතර ගිවිසුම අත්සන් කරන ලද වර්ෂය හා දිනය කුමක්ද?

.................................................

17).ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන කීයද?.....................................


18).වෙරළ ආශ්‍රිතව ඇති ප්‍රතිරෝධක පාෂාණ වලින් සමන්විත ප්‍රපාතාකාර බෑවුම හඳුන්වන නම කුමක්ද? .........................................

19).ශ්‍රී ලංකා නාවික හමුදාවේ ආදර්ශ පාඨය කුමක්ද? .................................................

20).වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද? ................................

- **21 සිට 25 දක්වා රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**

21).





1.මෙම රූපයේ අංක 5 න් පෙන්වන ප්‍රදේශයේ දැක්වෙන දේශගුණය නම් කරන්න.

2.අංක 3 න් දැක්වෙන ප්‍රදේශයේ ඇති ප්‍රධාන භූ විෂමතා ලක්ෂණයක් ලියන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

22).



1.මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

2.එතුමාගේ සොයා ගැනීම නම් කරන්න.

23).



1.මෙම රූපයේ සිටින පුද්ගලයා නම් කරන්න.

2.මොහු නායකත්වයගත් නිදහස් සටන කුමක්ද?

24).



1.මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2.මෙම රූපය ශ්‍රී ලංකාවේ දැක ගත හැකි ස්ථානයක් නම් කරන්න.

25).



1.මෙම රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

2.මෙම භූ විෂමතා කලාපය කුමක්ද?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න වලට ‘අ’ හා ‘ආ’ යනුවෙන් තීරු 2ක් දැක්වේ.ඒවායේ සම්බන්ධතාවය අනුව නිවැරදි ව ගළපා ඇති පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**26).** අ — ආ

1.ද්විත්ව පාලනය — A.මැක්ඩොවල් සෙනෙවියා

2.ක්‍රි.ව.1803 උඩරට ආක්‍රමණය — B.ටොරින්ටන් ආණ්ඩුකාරවරයා

3.ක්‍රි.ව.1818 පළමු නිදහස් සටන — C.ෆෙඩ්රික් නෝර්ත්

4.ක්‍රි.ව.1848 දෙවන නිදහස් සටන — D.රොබට් බ්‍රවුන්‍රිග්

1). ACDB 2). CABD 3). ACBD 4). CADB

27). අ — ආ

1.අඩුම වර්ෂාපතනය ලැබීම. — A. චෙරාපුංජි

2.මුහුදු මට්ටමේ පහළ පිහිටීම. — B.ගොබී

3.ලොව වැඩිම වර්ෂාපතනය ලැබීම. — C.එවරස්ට්

4.උසම කඳු ශිඛරය — D.මළ මුහුද

1).DABC 2).BDAC 3).DCBA 4).BACD

28). අ — ආ

1.සමාන්තර හෙල්වැටි — A. සීගිරිය

2.ශේෂ කඳු — B.රක්වාන කඳු

3.වෙරළ දඹ — C. මුතුරාජවෙළ

4.වගුරු බිම් — D.ත්‍රිකුණාමලය

1).DBAC 2).BADC 3).DBCA 4).BADC

29). අ — ආ

1.අධ්‍යාපන — A.ස්වංක්‍රීය ටේලර් යන්ත්‍රය

2.සෞඛ්‍ය — B.බහුමාධ්‍ය ප්‍රත්‍යේපනය

3.බැංකු — C.ස්ක්‍රියිප්

4.සන්නිවේදන — D.සී.ටී.ස්කැනර් යන්ත්‍රය

1).CADB 2).CBAD 3).BDCA 4).BDAC

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

30). අ | ආ

1.පළමුවන විමලධර්මසූරිය රජු — A.කොරනේලියස් වැකල්

2.ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු — B.කලන් අල්බස්

3.දෙවන රාජසිංහ රජු — C.ජොරිස්වැන් ස්පිල්බර්ජන්

4.දෙවන විමලධර්මසූරිය රජු — D.ජෙනරාල් ජෙරාඩ් හල්ෆ්ට්

1).CADB 2).CABD 3).CDAB 4).CADB

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

31).1).1638 ගිවිසුමට සම්බන්ධ රජු නම් කරන්න.

2).1766 ගිවිසුම සම්බන්ධ රජු නම් කරන්න.

32).1).1803 උඩරට ආක්‍රමණය සිදු කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා නම් කරන්න.

2).1815 ආක්‍රමණය සිදුකළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා නම් කරන්න.

33).1).ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණායතනය නම් කරන්න.

2).මුල් ම කෝපි වත්ත ආරම්භ කළ ඉංග්‍රීසි ජාතිකකයා නම් කරන්න.

34).1).ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රම 2ක් ලියන්න.

2).ශ්‍රී ලංකාවට නිරිත දිග මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව දක්වන්න.

35).1).ශ්‍රී ලංකාවේ දක්නට ඇති ජනාවාස වර්ග 2ක් ලියන්න.

2).ශ්‍රී ලංකාවේ අඩුම ජන ඝනත්වයක් ඇති දිස්ත්‍රික්කය හා වැඩිම ජන ඝනත්වයක් ඇති දිස්ත්‍රික්කය ලියන්න.

- **අංක 36 සිට 40 දක්වා ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කොට නම් කරන්න.**

36).මඩකලපුව

37).මහවැලි ගඟ

38).මහනුවර

39).කොළඹ

40).ත්‍රිකුණාමලය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

